# දරුවන් උදෙසා බයිබලයක්



# ප්‍රඥාවන්ත රජ, සලමොන්

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Lazarus
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

දාවිත් රජ දෙවියන් වහන්සේ ඉදිරියේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකු වූයේය. ඔහුගේ පාලන සමයේදී ඊශ්‍රායෙලය සාවුල් රජුගේ රාජ්‍යයට වඩා දස ගුණයකින් විශාල විය. නමුත් දැන් ඔහුට තවදුරටත් පාලනය කිරීමට නොහැකිය. දාවිත් මහලුව සිටියේය. වෙහෙසව සිටියේය! අසනීපව සිටියේය! මේ ලෝකයේ ඔහුගේ ජීවිත කාලය අවසන් වීමට ආසන්නව තිබුණේය.





හග්ගීත්ගේ පුත්‍ර වූ
අදොනියා ඊශ්‍රායෙල්
සෙනඟ අමතා දැන් රජ
වන්නේ ඔහු බව කීවේය.
ඔහුගේ නමේ තේරුම
“මගේ ස්වාමීන් වහන්සේ
දෙවියන් වහන්සේය” වුවද,
අදෝනියා හොඳ මිනිසෙකු
නොවූයේය. ඔහු
සිංහාසනය සොරකම්
කිරීමට උත්සාහ කළේ,
ඔහුට විරුද්ධ වීමට දාවිත්
දුර්වල බව දැන සිටි
නිසාය. නමුත් දෙවියන්
වහන්සේට වෙනත්
සැලසුම් තිබුණි!

දාවිත්ගේ භාර්යාව වූ
බැත්ෂෙබා තම පුත්
සලමොන් රජ විය යුතු බව
දැන සිටියාය. ඇය
අදෝනියාගේ සැලසුම්
ගැන දාවිත්ට කීවාය. ඔහු
අසනීපව සිටි නිසා දාවිත්
තම නායකයන්ව රැස් කර
ප්‍රසිද්ධියේ සලමොන්ව
ඊශ්‍රායෙල්හි රජු බවට
පත් කළේය.



ඊශ්‍රායෙල් සෙනඟ දාවිත් විශ්වාස කළ නිසා සලමොන්ට අදෝනියාගෙන් තවත් කරදර නොවීය. දාවිත්, දෙවියන් වහන්සේ ඔවුන්ගේ රජු ලෙස තෝරාගෙන ඇත්තේ සලමොන් බව ඔවුන්ට පැවසුවේය. ස්වල්ප කාලෙකට පසු දාවිත් මිය ගියේය.





දාවිත් මිය යාමට පෙර, දෙවියන්
වහන්සේට කීකරු වීම සහ
හොඳ රජෙකු වීම ගැන
සලමොන් සමඟ කතා කළේය.
“ඔබ කරන සෑම දෙයකින්ම
සමෘද්ධිමත් වන පිණිස
දෙවියන් වහන්සේගේ
මාර්ගවල ගමන් කරන්න” කියා
දාවිත් තම පුත්‍රයාට කීවේය.
එය යහපත් උපදෙසක් විය!
ඉන්පසු සලමොන් ඔහුගේ
පියවූ දාවිත්ගේ සිංහාසනය
මත හිඳගත් අතර ඔහුගේ
රාජ්‍යය ස්ථිර විය.

එක් රාත්රියක සලමොන්
හීනයක් දුටුවේය. සිහිනෙන්
දෙවියන් වහන්සේ ඔහුට
දර්ශනය වී, “ඉල්ලන්න!
මම ඔබට කුමක්
දිය යුතුදැ?”යි
ඇසූ සේක.
එවැනි
අවස්ථාවකදී
ඔබ කුමක්
ඉල්ලාවිද?



සලමොන්, යහපත් රජෙකු වීමට
ප්‍රඥාව ඉල්ලා සිටියේය. තරුණ
රජුගේ ඉල්ලීම ගැන දෙවියන්
වහන්සේ සතුටු වූ සේක.
සලමොන්ට ඔහු ඉල්ලූ
දේ ලැබුණි. නමුත්
දෙවියන් වහන්සේ
ඔහුට විශාල
ධනය හා
ගෞරවය
ලබාදෙන
බවටත්
පොරොන්දු
වූ සේක.



මිනිසුන්ට සලමොන්ගේ ප්‍රඥාව දැන ගැනීමට වැඩි කාලයක් ගත නොවීය. දිනක් ඔහු ඉදිරියට මව්වරු දෙදෙනෙක් දරුවකු සමඟ පැමිණියෝය. “මේ කාන්තාවගේ පුත්‍රයා රාත්‍රියේ මිය ගියේය, ඇය ඇගේ මියගිය දරුවා මාගේ ජීවත්ව සිටින දරුවා සමඟ මාරු කළායැ”යි එක් කාන්තාවක් පැවසුවාය. “නැත! ජීවත්ව සිටින දරුවා මාගේ පුත්‍රයාය, මියගිය දරුවා ඔබේ පුතායැ”යි අනෙක් කාන්තාව පැවසුවාය. සැබෑ මව කවුදැයි රජු පවසන්නේ කෙසේද?



ඉන්පසු රජතුමා “මට කඩුවක් ගෙනෙවැ”යි කීවේය. එබැවින් ඔවුහු රජු ඉදිරියට කඩුවක් ගෙනාවෝය. රජු කඩුවකින් කුමක් කිරීමට සැලසුම් කර ඇතැයි ඔබ සිතන්නේද?



රජතුමා "ජීවත්වන දරුවා දෙපළු කොට එක් මවකට අඩක්ද අනෙක් මවට අඩක්ද ලෙස දෙව"යි කීවේය. එවිට බිළිදාගේ මව, "අහෝ ස්වාමීනි, ඇයට දරුවා ලබා දෙන්න, ඔහුව කිසි ලෙසකින් නොමරන්නයැ"යි කීවාය.



නමුත් අනෙක් කාන්තාව
“ඔහු මාගේ හෝ ඔබගේ
හෝ නොවේවා, දෙපළු
කරන්නයැ”යි කීවාය.





“පළමු ස්ත්‍රියට දරුවා දෙන්න. සැබෑ මව ඇයයි” රජතුමා කීවේය. සියලු ඊශ්‍රායෙල්වරු විනිශ්චය ගැන අසා, රජුට බොහෝ සෙයින් ගෞරව කළෝය. දෙවියන් වහන්සේගේ ප්‍රඥාව ඔහු තුළ තිබෙන බව ඔවුහු දුටුවෝය.

ඊශ්‍රායෙල් ජනයාට දෙවියන් වහන්සේට නමස්කාර කිරීමට දේවමාළිගාවක් නොතිබුණි. දාවිත් දේවමාළිගාවක් සෑදීමට සැලසුම් කළ විට, දෙවියන් වහන්සේ, “ඔබේ පුත්‍රයා මාගේ නාමය වෙනුවෙන් නිවසක් ගොඩනගනු ඇතැ”යි කීසේක.



ඒ අනුව සලමොන් යෙරුසලමෙ ඉතා මනස්කාන්ත දේවමාළිගාවක් සෑදීම ඇරඹුවේය.

දේවමාළිගාව ඉදිකිරීමට
වසර හතක් ගත විය.
සලමොන් ස්වාමින්
වහන්සේට මාළිගාව කැප
කරන බව අසනු පිණිස
සියල්ලෝම රැස් වූ දවස
එළඹුනේය.



යාච්ඤාවකින් පසු, රජතුමා
සහ ජනතාව සතුටින් දහස්
ගණන් පුද පූජා පවත්වමින්
සති දෙකක් පුරා මහා
මංගල්යයක් පැවැත්වූවෝය!



මෙයින් පසු, දෙවියන් වහන්සේ
නැවතත් සලමොන්ට දර්ශනය
වී, ඔවුන් ස්වාමින් වහන්සේට
කීකරු වන තාක් කල් ඔහුට සහ
ඊශ්‍රායෙල්වරුන්ට ආශිර්වාද
කරන බවට පොරොන්දු වූ සේක!





කණගාටුදායක ලෙස, සලමොන් හෝ ඊශ්‍රායෙල් ජනයා සැමවිටම දෙවියන් වහන්සේට කීකරු නොවීය. දෙවියන් වහන්සේගේ අකමැත්ත මත රජතුමා බොහෝ කාන්තාවන් සමඟ විවාහ වූයේය. ඔහුගේ මිථ්‍යා දෘෂ්ඨික භාර්යාවෝ ඔහුගේ සිත පිළිමවලට යොමු කළෝය. ඔහුගේ පියා වූ දාවිත්ගේ සිත මෙන් ඔහුගේ සිත, දෙවි සමිදාණන් වහන්සේට පක්ෂපාත නොවී ය.



සලමොන් දෙවියන් වහන්සේට කීකරු වීමට තිබූ අවස්ථාව නාස්ති කරගනිද්දී, ඔහුගේ නිලධාරියෙකු වූ ජෙරොබොවම් අමුතු අත්දැකීමකට මුහුණ දුන්නේය. අනාගතවක්තෘවරයෙකු ඔහුට පැවසුවේ දෙවියන් වහන්සේ සලමොන්ගේ රාජ්‍යය බෙදන බවත්, ජෙරොබෝවම් ගෝත්‍ර දොළහෙන් දහයක් පාලනය කරන බවත්ය. ජෙරොබොවම් ඉක්මනින්ම ඊජිප්තුවට පලා ගියේය. ඔහු නැවතී සිටියහොත් සලමොන් ඔහුව මරා දමන බව ඔහු දැන සිටියේය.





අවසානයේ සලමොන්
මිය ගියේය. ඔහුගේ පුත්
රෙහොබෝවම්, සලමොන්ටත්
වඩා දරුණු ලෙස ජනතාවගෙන්
බදු අය කළේය. ගෝත්‍ර දහයක්
එක්ව කැරලි ගැසූ අතර ඔවුන්ගේ
නායකයා ලෙස ජෙරොබොවම්
තෝරා ගත්තෝය.
දෙවියන් වහන්සේගේ
අනාගතවක්තෘවරයා
පැවසූ ලෙසම
සලමොන්ගේ ශ්‍රේෂ්ඨ
රාජ්‍යය දෙකට බෙදී
ගියේය. දෙවියන්
වහන්සේ අකීකරු
වන්නන්ට ආශීර්වාද
නොකරන
සේක!

# ප්රඥාවන්ත රජ, සලමොන්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

1 රාජාවලිය 1-12

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)